# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

රාහුල් සමන්ත
හෙට්ටිආරච්චි,
නො.405/1
පන්සල පාර, වන්දුරුප්ප,
අම්බලන්තොට

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 796/2021**

එදිරිව

විදේශ සේවා නියුක්ති කාර්යාංශය
නො.234,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** :

1. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : දෙපාර්ශවය පෙනී නොසිටි.
පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.02.11
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.03.22

**තීරණය කළ දිනය** : 2022.03.22

**<u>තීරණය :</u>**

2022.02.11 දිනැති ලිපිය මගින්, තම අභියාචනය සම්බන්ධයෙන් අභියාචනා විභාගය පැවැත්වීමට අවශ්‍ය නොවන බව, අභියාචක විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*" .. අභියාචනා අංක 796/2021 යටතේ විදේශ සේවා නියුක්ති කාර්යංශයට අදාළ අභියාචනා විභාගයද පස්වරු 02ට යොදා තිබෙන අතර මේ වනවිට එම පොදු අධිකාරිය තොරතුරු ලබා දී ඇති හෙයින් එම අභියාචනා විභාගය පැවැත්වීමට අවශ්‍ය නොවන බවද මෙයින් දන්වා සිටිමි."*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතින්හි, රීති අංක 30(1) පහත පරිදි වේ.

*"අභියාචනයක් විභාග වෙමින් පවතින විට අභියාචකට ඕනෑම අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත ලිඛිතව හේතු දක්වා, ඔහු/ඇය විසින්ම අත්සන් කර, අනෙක් පාර්ශවය/න් වෙත ලබාදීම සඳහා පිටපතක් ද සමග ඉදිරිපත් කිරීම මගින් සිය අභියාචනය ඉවත් කර ගැනීමට හැකි අතර, කොමිෂන් සභාව අනතුරුව සියලු පාර්ශවයන්ට මෙකී අභියාචනය ඉවත් කර ගැනීම පිළිබඳ දැනුම්දීම ලබාදෙනු ඇත."*

රීති අංක 30(3) පහත පරිදි වේ.

*"ඉහත උප රීති (1) සහ (2) හි සඳහන් කරන හේතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තෘප්ත වේ නම්, අභියාචනය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු ඇත."*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතින්හි, රීති අංක 30(3) ප්‍රකාරව, ලබාදී ඇති හේතුන් වලින් කොමිෂන් සභාව සෑහීමකට පත්වී ඇති බැවින් අභියාචනය ඉවත් කර ගැනීමට අවසර දෙමින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබේ..

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය නිෂ්ප්‍රභා කරන ලදී.